රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ : 27/2013

මගේ අංකය: EST-7OFTIM/07/3020
රාජ්‍ය පරිපාලන සහ ස්වදේශ
කටයුතු අමාත්‍යාංශය
නිදහස් චතුරස්‍රය
කොළඹ 07

2013.11.26

අමාත්‍යාංශ ලේකම්වරුන්
පළාත් ප්‍රධාන ලේකම්වරුන්
දෙපාර්තමේන්තු ප්‍රධානීන්

**<u>මෝටර් රථ රියදුරන් සඳහා රාජකාරී වේලාවන්</u>**

ඉහත කරුණ සම්බන්ධයෙන් නිකුත් කරන ලද 2003.04.03 දිනැති අංක 04/2003 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය කෙරේ ඔබේ අවධානය යොමු කරවමි.

02. එකී චක්‍රලේඛයේ විධිවිධාන අවලංගු කර පහත සඳහන් විධිවිධාන ඇතුළත් කරමින් නව චක්‍රලේඛයක් නිකුත් කිරීමට 2013.10.03 දින පැවති අමාත්‍ය මණ්ඩල රැස්වීමේ දී තීරණය කර ඇත.

I. මෝටර් රථ රියදුරන් දින පහේ සතියක් රාජකාරියේ යෙදෙන්නේ නම් දිවා ආහාර විවේකය ද ඇතුළුව දිනකට පැය නවයක් සේවය කළ යුතුය.

II. දින හයේ සතියක් රාජකාරියේ යෙදෙන්නේ නම් දිවා ආහාර විවේකය ද ඇතුළුව දිනකට පැය හතහමාරක් සේවය කළ යුතුය.

III. සෙනසුරාදා දිනයන්හි ද රාජකාරියෙහි යෙදීමට නියමිත රියදුරන් සඳහා එදින පැය හයහමාරක් සේවය කිරීමෙන් සතියකට නියමිත පැය ගණන වන පැය 45 ආවරණය කිරීමට ඉඩ දිය හැක.

IV. නිශ්චිත රාජකාරී හෝ විශේෂ රාජකාරී පවරා නොමැති අවස්ථාවල දී සංචිතයේ සේවය කරන රියදුරන්ට පමණක් පෙ.ව.8.00 හෝ ඊට පෙර හෝ සේවයට වාර්තා කර ඇත්නම් පමණක් ප.ව. 4.15 ට කාර්යාලයෙන් බැහැරව යාමට අවසර ලබා දීමේ බලය දෙපාර්තමේන්තු ප්‍රධානියා වෙත මෙයින් පවරනු ලැබේ.

V. අතිකාල ගෙවීමේ දී ඉහත I, II, III උප ඡේද යටතේ සඳහන් කළ කාල වේලාවන් සම්පූර්ණ කිරීමෙන් අනතුරුව වූ පැය ගණන අදාළ කර ගනිමින් අතිකාල ගෙවීම් කළ යුතුය.

03. මෙම චක්‍රලේඛය මහා භාණ්ඩාගාරයේ එකඟත්වය ඇතිව නිකුත් කරන ලදී.

පී.බී. අබේකෝන්
ලේකම්
රාජ්‍ය පරිපාලන සහ ස්වදේශ කටයුතු අමාත්‍යාංශය